# දසත Dasatha

මාසික සංග්‍රහය. 2010 මැයි. 17 කලාපය www.dasatha.com




**Best Homes For You**

- Free Home Evolution
- Search the entire MLS
- Critical Sellers Information
- Critical Buyer Tips
- Find Comparable Homes
- Important Market News

**'Beyond Your Expectations'**

**For ALL Your Real Estate Needs**

**CALL NOW**

**Gamini Abeysinghe.** ABR

Real Estate Sales Representative

**Direct : 416 822 2789**

RE/MAX Diamond Realty Inc., Brokerage





සරල වන්න, අවංක වන්න, ඔබගේ ගෙදර දෙවොලේ පින්තූර හා දේව රූප මල්මාලාවලින් පුරවා, වටිනා බඳුන්වල නොයෙක් පුද පූජා ජාති දක්වා ඔබගේ භක්තිය ප්‍රදර්ශනය කිරීමෙන් සිදුවන්නේ මුදල් අපතේ යැවීමක් පමණි. මෙය වංචාවකි. දෙවියන්ට අවමානයකි. අලංකාරයටත් ප්‍රචාරයටත් ඇති ආශාව පිළිබිඹු කරන්නකි. ආශිර්වාදය ඔබ වෙත හෙලන්නට මා ඉල්ලන්නේ හදේ පවිත්‍රතාව පමණි. ඔබත් මමත් අතර ගුරු-යහලු සබඳතාව හෝ දේව-බැති සබඳතාව හෝ ඇති කර ගන්න එපා. මම ගුරු කෙනෙක් නොවෙමි. දෙවියෙක් නොවෙමි. මම ඔබයි. ඔබ මමයි. මෙයයි සත්‍යය. ඔබත් මමත් යනුවෙන් වෙනසක් නැත. ඒ වෙනස මායාවකි. ඔබ තරංගමාලා වේ. මම මහා සමුද්‍රය වෙමි. මෙය අවබෝධ කොට ගන්න. ඉන්පසු විමුක්ත වන්න. දිව්‍යමය වන්න.

සබ්බේ සත්තා සුඛිනෝ භවන්තු
ලෝකා සමස්තා සුඛිනෝ භවන්තු
ඕම් ශාන්ති...! ශාන්ති...!! ශාන්ති...!!!

භගවාන් ශ්‍රී සත්‍ය සායි බාබා

# දසත Dasatha

මාසික සංග්‍රහය. 2011 මැයි කලාපය

Web : www.dasatha.com E-mail : dasathainfo@gmail.com

## පිටු යොමුව

කතු වැකිය ........................................... 4
බුදුරජාණන් වහන්සේගේ
උත්තරීතර මානුෂිකත්වය......................... 5
ශ්‍රී ලංකාවේ මෑත කාලීන
ප්‍රථම වෙසක් දිනය................................. 6
මා පන්සලට ගරු කරන්නේ..................... 9
සම්බුදු කරුණාව
හා කාන්තා විමුක්තිය............................. 10
සසරින් මිදීම......................................... 11
ථෙරවාද හා මහායාන
බුද්ධ සංකල්පය.................................... 12
අහිමි වූ නිධානය (ළමා කතාව)............... 14
මනෝ වික්ෂිප්තභාවය(සුව සෙත)............. 16
දසබලධාරි රාවණ ශ්‍රී ලංකාධිපති............. 19
ගී මුතු වැල්.......................................... 20
මගේ හදවත ළමුන්ට දෙමි ..................... 25
නා ගහ ළඟ ගෙදර(නවකතාව)............... 29
ගෙවල් කුලී ආදායම බදු ගණනයේදී
ගලපන අයුරු (Canada Tax).................. 33
ලොවට ඕනෑ මෙහෙවු මිනිසුන්................. 33
බටහිර අධිරාජ්‍යවාදයේ රූදාවට නගන
බන් කී මුන්ගේ අවලාද (විනිවිද).............. 34
ග්‍රහචාරය( කෙටිකතාව).......................... 36
නිරෝගි දිවියකට වෛද්‍ය උපදෙස්............ 41
කැනඩාපුර ළමා ගම්මානය විවෘත වේ...... 42

දසත සඟරාවේ පළවන ලිපිවල අන්තර්ගතය ලේඛකයින් සතුයි.



මහ බඹුට, දෙවිවරුනට, මැවුම් කරුවනට වැඳුම් කළ රටක එබඳු යුගයක මිනිසකු වූ බුදුන් වහන්සේ ඉපිද අනික් මිනිසුන් බලා සිටිද්දී දෙවියන්ගෙන් බඹුන්ගෙන් වැඳුම් පිදුම් ලැබූහ. අප උපස්ථාන ලැබූහ. මීට වඩා ආශ්චර්යයක් ඒ යුගයේ කවර නම් මනුෂ්‍යයකුගෙන්වත් සිදු නොවිය. සිල්වත් ගුණවත් මිනිසාට දෙවියන්ට වඩා ගරු බුහුමන් කරන බව බුදුහු වදාළහ.

පිටුව - 5

රාවණ රජු අර්කශාස්ත්‍ර-කුමාරතන්ත්‍ර යන වෛද්‍ය හා ජෝතිෂ ග්‍රන්ථ කරවූ මහා ප්‍රාඥයකු වීම, සංගීත නාට්‍ය චිත්‍ර ශිල්ප ආදි කලාවන්හි නිපුණයකු වීම යන විශේෂතාද ගලපා ගත් විට ස්ත්‍රී බලහත්කාරකම් සම්බන්ධ චෝදනා මෙතුමන් වෙත ආරෝපණය කිරීමේ හේතුව එතුමන් සතු කීර්තිරාවය වැනසීම හා මහා වීරයකු ගොඩ නැගීම සඳහා ප්‍රබල දුෂ්ටයකුද නිර්මාණය කිරීම මහා කාව්‍ය සම්ප්‍රදාය වන නිසාය.



පිටුව - 19



“මම හිතනවා ඔබේ අපල කාලය ගෙවෙන්න ළඟයි. ඉක්මනින් හොඳ කාලයක් ලබනවා. නමුත් හෙට සඳුදා දවසම පුළුවන් තරම් පරිස්සමෙන් කතා කරන්න. කතා නොකර ඉන්න තරමට හොඳයි. ඔබ කියන දේ වැරදියට ඇහිල එහෙමත් නැත්තම් අනුන් කියන දේ ඔබට වැරදි විදියට ඇහිල ලොකු ප්‍රශ්ණයක් වෙන්න පුළුවන්. ඒ හින්ද කතා කරන එක පුළුවන් තරම් මග හරින්න. කට පරිස්සම් කරගන්න”

පිටුව - 36



Dasatha Publications
Free Issue Monthly Canada. May 2011

# බුද්ධත්ව ජයන්ති අදිටන

මෙවර දසත පළවන්නේ බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් විශේෂ අතිරේකයක්ද සමගය. එය ඔබේ ජීවිතවලට ආලෝකයක්, සැනසුමක් වේවායි යනු අපේ ප්‍රාර්ථනාවයි.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව ගත වන 2600 වන වසරයි මේ. මෙය සකල ලෝකවාසි බෞද්ධ ජනතාවට පමණක් නොව මුළුමහත් ලෝකයාටම වැදගත් වන වසරකි. ඒ අන් කිසිවක් නිසා නොව. ආගමික භේදයකින් තොරව මුල්ම බුද්ධ දේශනය වන දම්සක් පැවතුම් සූත්‍රයෙහිදී "ආලෝකෝ උදපාදි"(ආලෝකය පහළ විය) යන්නෙන් දැක්වූවා සේම සියලු මිනිසුන්ට බුද්ධිමය ආලෝකය ලබා දුන් වසර මෙය වන හෙයිනි. බුදුරජාණන් වහන්සේ අවබෝධ කොට ගත් දහමෙහි ඕනෑම මිනිසෙකුගේ ජීවිතවල පැන නගින ගැටලුවලට පිළිතුරු ගැබ්ව ඇති අතර උන්වහන්සේ දේශනා කළ ධර්මයෙහි එකදු වචනයකට හෝ විවේචනයක් ඉදිරිපත් කිරීමට මේ 2600 වන වසර දක්වාම කිසිවෙක් සමත් නොවූහ. ඉදිරියේදීද එය එසේම වනු ඇත. මිනිසුනට උන්වහන්සේ ගෙනහැර දැක්වූයේ අන් කිසිවක් නොව. යහපත් ජීවිතයක් සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයයි. සමස්ත බුද්ධ ධර්මය හකුළුවා බැලූ විට ප්‍රත්‍යක්ෂ වන්නේ මේ සත්‍යයයි. එවැනි යහපත් මිනිසකු අවසානයේ ලබන ඵලය වන්නේ විමුක්තියයි. නිවනින් සැනසීමයි.

කරුණු මෙසේ වුවද වර්තමානයෙහි ලෝකය පුරා මේ ශ්‍රේෂ්ඨ දහම හරිහැටි අනුගමනය කරන්නෝ කීයෙන් කීදෙනෙක් වෙත්ද? පන්සිල් පමණක් ගත්තද මෙකරුණ සනාථ වන්නේය. පරපණ නැසීම යනු ජීවය විනාශ කිරීම පමණක්ම නොවේ. තමන්ට සිදුවන සුළු අලාභයන් හමුවේ ඔහු නැසේවායි පැතීමත්, සිතීමත් පරපණ නැසීමේ අකුසලයට අයත් වෙයි. මිනිසුන් අතර, රටවල් අතර අද සිදුවන මනුෂ්‍ය ඝාතන සියල්ලකටම හේතුව මිනිසා තුළින් අනුන්ගේ ජීවිත පිළිබඳව ඇති කර ගත යුතු මේ වටිනා ආදර්ශය තුරන් වීම නොවේද? අනවශ්‍ය යුද්ධ නිසා, දේශපාලන වුවමනාවන් නිසා, පෞද්ගලික තරහ මරහ නිසා අද ලෝකය පුරා වැනසෙන ජීවිත මේ සිල්පදය අවබෝධයෙන් යුතුව රකින්නේ නම් ආරක්ෂා නොවන්නේද? අන් සතු දෙය අයිති කර ගැනීමට යාමෙන් ලෝකය තුළ ඇතිවන කැළඹීම් කොපමණද? ලද දෙයින් සැනසී සිටින ලෝකය කොතරම් සැනසිලිදායක වන්නේද? බුදුන් වදාළ දෙවන සිල්පදය රැකේ නම් ලෝකයා නිසැකවම ඒ සැනසිල්ල නොලබන්නේද? කම්සැපයෙහි වැරදි ලෙස ගැලීමෙන් මිනිසුන් අත් කර ගන්නා විපත්තිදායක තත්ත්වයන් අද කොතෙකුත් අසන්නට ලැබේ. පවුල්අවුල් වීම වැනි සමාජ ප්‍රශ්න මෙන්ම ඒඩ්ස් වැනි භයානක රෝගවලට පවා අද එය තුඩු දී ඇත. තෙවැනි සිල්පදය රකින්නේ නම් එවැනි දෑ අසන්නට, දකින්නට සිදු නොවනු ඇත. බොරුව හා වංචාව වර්තමාන ලෝකය උඩු යටිකුරු කොට ඇත. සාමාන්‍ය මිනිසාගේ පටන් ඉහළම රාජ්‍ය තාන්ත්‍රිකයන් දක්වා වූ ලෝකය දියත් වන්නේ බොරුවෙනි. මුලාවෙනි. ආත්මලාභය, බලතණ්හාව ආදිය හමුවෙහි ඕනෑම බොරුවක් කියන්නට වර්තමාන මිනිසුන්ගේ දිව නැවෙයි. මනස ක්‍රියාකාරී වෙයි. එහි ප්‍රතිඵලය වනුයේ බොරුව හෙළිවූදා නොසිතූ විරූ විපත්වලට බොරු කියන්නවුන් පමණක් නොව මුළුමහත් සමාජයම ගොදුරු වීමයි. පවුලෙන් පටන් ගෙන රජය දක්වා සියලු සංස්ථා ව්‍යාකූලත්වයට පත්වීමයි. සිව්වන ශික්ෂා පදය මිනිසුන් අතින් රැකේ නම් එම සංස්ථා එවැනි තත්ත්වයකට පත්වීමෙන් වළක්වා ගත හැකි නොවන්නේද? මත්පැන්, මත්ද්‍රව්‍ය වර්තමාන ලෝකයට කර ඇති හානිය දකින කාහට නම් පස්වන සිල්පදය කොතරම් අගනේදැයි නොවැටහෙන්නේද? මේ සිල්පදය ආරක්ෂා වන්නේ නම් මත්පැන්, මත්ද්‍රව්‍ය පානය පමණක් නොව මත්පැන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝද ලෝකයෙන් තුරන් නොවන්නෝද? දවසකට දහපහළොස් වතාවක් මුවින් පමණක් පන්සිල් ගත්තද එය නොරකින්නේ නම් ඔහුට බෞද්ධයෙකැයි කිව නොහැකිය.

එබැවින් මේ බුද්ධත්ව ජයන්ති වෙසක් පුන් පොහෝ දිනයෙහි එය සැමරීමට සැරසෙන අපි අඩුම තරමින් මුවින් පමණක් පන්සිල් ගෙන අපවම රවටා නොගනිමින් එම පන්සිල් රැකීමටත් එමගින් බුදුරජුන් දෙසූ බුදු දහම අනුගමනය කොට මේ උතුම් අවස්ථාව සැමරීමටත් ප්‍රතිපත්තියෙන් පෙළ ගැසෙමු.



සංස්කාරක

Consultant Editors
Well known Writer
Sirisena Vithanage
Ex Additional secretary,
Ministry of Education

Veteran journalist
Sujeewa Disanayake
Ex Chief Editor Silumina News Paper

Editor in Chief
Chamari Abeysinghe

Associate Editor
Nandana Prasadh

Graphic Design & Layout
Chamari Abeysinghe

Creative graphics
Jagath Hewapanna

Web Master
Dhanushka Bandara

Editorial Assistant
Gamini Abeysinghe

**Contact Us**
**Publisher**
**Dasatha Publications**
**1709-260 Scarlett Rd**
**Toronto, Ontario**
**M6N 4X6 Canada**

**Telephone : 416 822 2789**
**Fax : 416 241 3391**
**E-Mail : dasathainfo@gmail.com**
**Web : www.dasatha.com**



# 2600 සම්බුද්ධත්ව ජයන්තිය

## දසත විශේෂ අතිරේකය



# බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මානුෂිකත්වය

ශ්‍යාමෝපාලි මහා නිකායයේ මල්වතු පාර්ශවයේ මහා නායක
අතිපූජ්‍ය තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල හිමිපාණෝ

උදාරත්වය හා සම්භාව්‍යත්වය චරිතාපදානයක මූලික ලක්ෂණයක් ලෙස සැලකිය හැකිය. සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ පටන් බුද්ධ පරිනිර්වාණය දක්වා ඇතැම් සිද්ධි නිරූපණයේදී නිසාම බුද්ධ චරිතය තුළින් ඒ අසාමාන්‍ය ලක්ෂණ පහළ වී ඇත.

සන්තුසිත දිව්‍යරාජව සිටිමින් පස්මහ බැලුම් බැලූ බෝසතාණන් වහන්සේට කාලය, දේශය, දීපය, කුලය, මවු යන පස්මහ බැලුමෙන් ප්‍රමුදිත සිත් ඇති වූ වගත් බුද්ධ චරිතය තුළින් ගම්‍ය වී ඇත. බුද්ධ ජන්මය සිදු වූ කාල පරිච්ඡේදය වර්ගවාදයෙන් සමාජය දූෂණයට පාත්‍රව තිබුණකි බ්‍රහ්ම නිර්මිතය අනුව සිදු කළ සමාජ සංස්කරණය බෞද්ධ දර්ශනයට අනුරූප නොවුවද එය පාදක කොට ගෙන බෞද්ධ සංස්කෘතික ඉතිහාසය ගෙන හැර දැක්වීමට හුරුපුරුදු වී ඇත. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය යන දෙකුලයම කලින් කලට ප්‍රධාන හෝ අප්‍රධාන වී ඇති වග ඉතා පැහැදිලිය. බුද්ධ කාලයෙහි ක්ෂත්‍රිය කෝලිය දෙවංශිකයින්ම බ්‍රාහ්මණ වර්ග වාදයෙන් පීඩනයට ලක්ව සිටි බව පෙනෙයි. ඔවුන්ගේ අවවාද අනුශාසනා ඉක්මවීමට තබා ඒ ගැන සිතීම පවා උගහට කරුණක් විය. ඒ ජන්මයේ සිට මරණය දක්වාම ජීව පරිපාලන කාර්ය සමුදායක බමුණන් නිරත වීම නිසාය.

මේ වන විට සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ පරමායුෂ වූයේ 80-120 අතර කාලයයි. එබැවින් ත්‍රිලක්ෂණය අවබෝධයට සුදුසුම කාල පරිච්ඡේදය ලෙස සිදුහත් බෝසතාණන් සලකන්නට ඇතිවාට කිසිදු සැකයක් නැත. දේශය වූයේ මධ්‍ය දේශයයි. ධනික, නිර්ධනික, කුලීන ආදි විවිධ වාර්ගික ජන සමූහයක් මෙහි වාසය කළහ. සැබවින්ම සංකීර්ණ දිවි පෙවෙතක් එකල මධ්‍ය දේශයෙහි පැවතිණ. දීපය වූයේ දඹදිව හෙවත් ජම්බුද්වීපයයි. සතර මහා දිවයින් අතරින් උත්තරීතර මනුෂ්‍ය රාජධානිය ලෙස දඹදිව ප්‍රකටය. එය බ්‍රාහ්මණ සමාජ ධර්ම මත ගොඩ නැගිණි. එහෙත් මේ වන විට පැවතියේ ක්ෂත්‍රිය මූලික පාලන තන්ත්‍රයකි. සමානාත්මතාව බුදු දහමෙහි පදනම වුවද පහත් කුලයක ඉපදී කුල භේදයෙහි නිසරුකම අවබෝධ කරලීම ඉතා අසීරු කාරියකි. එය ඊර්ෂ්‍යාවෙන් කරන දේශනයක් ලෙස සලකා ජනතාව ප්‍රතික්ෂේප කරනු ඇත. එබැවින් එකල පැවති උච්චතම කුලයෙහි ඉපදුනාට සැක ඇත. සුත්ත නිපාතයේ පබ්බජ්ජා සූත්‍රයෙන්ද මෙය ඔප්පු වේ. කුමාරෝත්පත්තියෙන් සත් දිනක් ඇවෑමත් සමගම මහාමායා දේවි තොමෝ කලුරිය කළායයි බුද්ධ චරිතය සඳහන් කරයි. මෙවන් කුසයක පිළිසිඳීම පූර්ව බුදුවරයන් පවා අනුගමනය කළ තවත් සිරිතක් දක්වා බුදුසිරිත පූර්වාපර සන්ධි ගැලපීමකටද යොදාගෙන ඇත. බුද්ධත්වයට හෝ සක්විති රජ වන්නකුට හෝ ප්‍රතිසන්ධි ලාභය ලද කුසයක තවත් සාමාන්‍ය පුද්ගලයකු පිළිසිඳ ගැනීම අනුචිත තරම් නොවන සිදුවීමත් ලෙස සලකන්නට ඇති බවද පෙනෙයි. එම නිසා පූර්වෝක්ත සිද්ධි විශ්ලේෂණයේදීද බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මානුෂිකත්වයට හේතු සාධක සොයා ගත හැකිය.

"අග්ගෝ හමස්මි ලෝකස්ස"(මම ලොවට අග්‍ර වෙමි)යයි උපන් විගස සත් පියුම් මත ගමන් කොට අන්තිම පියුම මත සිට ප්‍රකාශ කළ වගක් බුද්ධ චරිතයෙහි දැක්වෙයි. ඒ වන විට කිසිම ධ්‍යානයක් නොලබා පෘථග්ජන පුද්ගලයකු වශයෙන් සිටි නිසා එසේ ප්‍රකාශ කරන්නට ඇත. බුද්ධත්වයට පත් වීමෙන් පසුව සකල ලෝකයාටම කිසිදු තැනකදී තමන් වහන්සේ අභිමානවත් පුද්ගලයකු ලෙස හඳුන්වා දීමට තැත් නොකළහ. මිනිසකු වශයෙන් ලොව පහළව උත්තරීතර මිනිසකුව ජීවත්ව අසහාය මිනිසකු වශයෙන් මෙලොවින් සමුගත් අති විශිෂ්ට ගණයේ පුද්ගල චරිතයත් උන් වහන්සේට තිබිණ. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පෙරුම්දම් පිරූ උන් වහන්සේ උත්තරීතර ගුණාංග රාශියකින් පිරිපුන් අති විශිෂ්ට ගණයේ මනුෂ්‍ය රත්නයක් වූහ.

බුදුරජාණන් වහන්සේ පිළිබඳ සංයුක්ත නිකායේ ලාභ සත්කාර සංයුක්තයේ මෙසේ සඳහන් වේ.

දරුණො භික්ඛවේ ලාභ සත්කාර සිලෝකෝ කටුකෝ ඵරුසෝ අන්තරායිකෝ අනුත්තරස්ස යෝගක්ඛෙමස්ස අධිගමාය

(මහණෙනි.. ලාභ සත්කාර කීර්ති ප්‍රසංශා දරුණුය. තියුණුය. අනුත්තර රහත් බව ලබා ගැනීම පිණිස අන්තරායකරය)

උන්වහන්සේ ලෝකයා තුළ පවත්නා වූ අවිද්‍යාව, නොදැනීම, නූගත්කම, වැරදි දෘෂ්ටිය, වැරදි මත, වැරදි ක්‍රියා පෙන්වා දීම සඳහාම පහළ වූ උතුමෙකි. එබඳු උතුමෙක් ලෝකයාගෙන් සීමාව ඉක්ම වූ ගෞරවාචාර කිසිසේත් බලාපොරොත්තු නොවෙයි.

"උපුලක් හෝ පියුමක් හෝ හෙළ පියුමක් හෝ දියෙහි ඉපිද දියෙහි වැඩී දියෙන් ඉස්මතු වී දියෙහි නොගෑවී තිබෙනවා වගේ මමත් ලෝකයෙහි මිනිසුන් අතර ඉපිද ලෝකයෙහි මිනිසුන් අතර වැඩී ලෝකයාගෙන්, මිනිසුන්ගෙන් ඉස්මතු වී ලෝකයා සමග නොගැටී, නොගෑවී, නොබැඳී සිටිමි"යයි දිනක් උක්කට්ඨා හා සේතව්‍යා යන නගර දෙක අතර පා ගමනින් වඩිද්දී ඒ මගෙහිම යන ද්‍රෝණ නම් බමුණා බුදුරදුන්ගේ පා සටහන් දැක ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ වදාළහ. තවදුරටත් බුදුරජාණන් වහන්සේ බමුණාට වදාළේ මම මිනිස් දුර්වලකම් සියල්ලම නැති කළ උත්තර මනුෂ්‍යයෙක්මි(උත්තර මනුස්සො) කොටින්ම මම බුදුවරයෙක්මි. මා හැඳින්විය යුතු හොඳම නම බුද්ධ යනුයි. (බුද්ධොති මං බ්‍රාහ්මණ ධාරෙහි) යනුවෙන් අංගුත්තර නිකායේ චතුත්ථ නිපාතයේ ද්‍රෝණ ලෝක සූත්‍රයෙහි සඳහන් වේ.

බුදුන් වහන්සේ හා බමුණකු අතර සිදුවී ඇති මේ සාකච්ඡාවෙන් පෙනී යන්නේ කෙලෙසුන්ගෙන් පිරුණු සාමාන්‍ය මිනිසුන් සඳහා පොදුවේ යෙදෙන මනුෂ්‍ය යන මේ වචනය බුදුහාමුදුරුවන් ගැන යෙදිය යුත්තේ සුර අසුර, නර නාග ආදි සත්ත්ව ජාතීන් හැඳින්වීමේදී පමණක් බවත් එසේ නොවූ තැන බුද්ධ යනුවෙන් හැඳින්වීම සුදුසු බවත්ය.

බුදුන් වහන්සේගේ ජීවිතය පරිච්ඡේද දෙකකින් යුක්තය. සිද්ධාර්ථ කුමාර කාලයේ සිට බුද්ධත්වය ලබන තුරු උන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙකි. බෝධිසත්ව වරයෙකි. බුදු බව ලැබූ කෙණෙහි සිට සියලු මිනිසුන් තුළ පවත්නා රාගාදි ක්ලේශ ධර්මයන් සම්පූර්ණයෙන්ම නැති කළ බැවින් උත්තරීතර මනුෂ්‍යයෙකි. මනුෂ්‍යයන් අතර මෙතෙක් උපන් ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයාය. උන්වහන්සේ සම කළ හැක්කේ තවත් මිනිසකුට නොව බුදුවරයකුට පමණි. උන්වහන්සේට සමකළ හැකි තවත් මිනිසකු නැති නිසා අසමසම යනුවෙන් හැඳින්වෙයි.. බුදුහාමුදුරුවෝ පුද්ගලයන් අතර ආශ්චර්යවත් පුද්ගලයෙකි.(අච්ඡරියෝ පුග්ගලෝ) මනුෂ්‍යයන් අතර ආශ්චර්යවත් පුද්ගලයෙකි.(අච්ඡරියෝ මනුස්සෝ) එබඳු දෙදෙනකු එකවර දක්නට නැති නිසා එකම පුද්ගලයෙකි.(ඒකපුග්ගලෝ)

සිදුහත් කුමරා මිනිස් මවුපියන්ට දාව මිනිස් සිරුරක් ඇතිව ඉපිද බුදුවරයකු මෙන් ජීවත්ව සිට මිනිස් ආයුෂ වළඳා උත්තරීතර මනුෂ්‍යයකු වශයෙන් පිරිනිවන් පෑවේය. සියලු මිනිසුන් තුළ දක්නට ඇති රාග, ද්වේෂ, මෝහ, මද, මාන, ඊර්ෂ්‍යා, ක්‍රෝධ ආදි ක්ලේෂ ධර්මයෝ උන් වහන්සේ තුළ අවිද්‍යමාන විය. මිනිසුන්ට අයත් මිනිසුන් තුළම දක්නට ලැබෙන මෛත්‍රි, කරුණා, මුදිතා, උපේක්ෂා, සීල, සමාධි, ප්‍රඥා ආදි ශ්‍රේෂ්ඨ මිනිස් ගති උන් වහන්සේ තුළ විද්‍යමාන විය.

උන් වහන්සේ කථා කළේ එකල ව්‍යවහාරයෙහි ඇති කාටත් තේරෙන මිනිසුන් කථා කරන භාෂාවෙනි. උන් වහන්සේ වැළඳූයේ මිනිසුන් කන බොන ආහාරපාන වර්ගයි. උන් වහන්සේගේ කථා ව්‍යවහාරයේ මිනිස් ලක්ෂණ හොඳින් දිස්වෙන තැන් බොහෝය.

පරිපක්කෝ වයෝ මය්හං
පරිපත්තං මම ජීවිතං
පහාය වෝ ගමිස්සාමි
කතං වෝ සරණ මත්තනා

(මම දැන් මහල්ලෙක්මි. මට ජීවත් වීමට ඇත්තේ තව ස්වල්ප වේලාවකි. මම නුඹලා අතහැර දමා යන්නෙමි. මා විසින් නුඹලාට කළ යුතු උපකාරය, පිහිට කරන ලද්දේය.)

මහලු පියකු තම මරණ මඤ්චකය වටා රැස්ව සිටින දූදරුවන් අමතා කියන අන්තිම වචනයේ විලාසය මෙහි දක්නට ඇත. බුදුන් වහන්සේ මිනිසකු වශයෙන් මිනිසුන් සමග කථා කරනු මෙහි ඉතා හොඳින් දැක්වේ.

තවද මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි එන පරිදි "ආනන්දය, මම දැන් ජරාවට, වැඩි වයසට, මහලු බවට, වයස්ගත බවට පත් වීමි. මගේ වයස අසූවකි. දිරූ රියක් රෝද බැඳීම් ආදි ප්‍රතිසංස්කරණයෙන් අල්ලා සිටිනවා වාගේ මාගේ කයද අරිහත් බලවේගයෙන් බඳනා ලදුව අල්ලා සිටී" යනාදි වශයෙන් අසූ

8වන පිටුව බලන්න

# 2600 සම්බුද්ධත්ව ජයන්තිය

## දසත විශේෂ අතිරේකය




රාජ්‍ය ලේඛනාගාරයේ නාමාවලිය සංස්කාරකව සිටි

**නුවරඑළියේ හේමපාල විසිනි**

සර්වඥයන් වහන්සේ පිරිනිවන් පා වසර තුන් සියයක් පමණ ඉක්ම යනතුරුම උන් වහන්සේගේ තෙමඟුල වෙසෙසින් සැමරෙන වෙසක් උළෙලක් නොපැවති බැව් බෞද්ධ ඉතිහාසඥයින්ගේ මතයයි.

සදහම් පණිවුඩය ලෝ දසත පතුරා බුදු දහම ලෝ දහම බවට පත් කිරීමට වෙර දැරූ අශෝක අධිරාජයාගේ සෙල් ලිපියකින් එවකට පැවති පෙරහැරක් පිළිබඳ තතු හෙළි වෙයි. අලි ඇතුන් සහිත එම පෙරහැරේ දේව රූපද ගෙන ගිය බව කියවෙයි. ඉන්පසු එවැනි උළෙලක් ගැන සඳහන් වනුයේ ඊට වසර අට සියයකට පමණ පසු ඉන්දියාවට පැමිණි පාහියන් නමැති චීන ජාතික දේශ සංචාරක භික්ෂුවගේ දේශාටන වාර්තාවෙහිය. පාටලී පුත්‍ර නගරයේ පැවති පිළිම පෙරහැරක් පිළිබඳ ඔහුගේ විස්තරය පිළිවිසින ඉතිහාසඥයෝ එදා එසේ පවත්වන ලද්දේ වෙසක් උළෙල විය යුතු යැයි නිගමනය කරති. ඉන්දියාවේ මෙම උත්සවය වෛශාඛ පූර්ණිමා යනුවෙන් හඳුන්වනු ලැබේ.

ක්‍රි.පූ. 543දී විජය කුමරු ඇතුළු පිරිස වෙසක් පුන් පොහෝ දින ලක්දිවට ගොඩ බැස ඇත. දේවානම්පියතිස්ස රජතුමා(ක්‍රි.පූ.220-210) දෙවන වරට රාජාභිෂේක වූයේද වෙසක් පුන් පොහෝ දිනකදීය. අනතුරුව දෙවනපෑතිස් මහ රජු සමයේ සිදු වූ මහින්දාගමනයෙන් පසු සතර පොහෝ දින ලක්වැසි දන උපෝසථයෙන් කල්ගත කළ බවට කරුණු හෙළිදරව් කරන මහාවංශය දුටුගැමුණු මහ රජතුමාගේ රාජ්‍ය කාලයේ වෙසක් උත්සව සූවිස්සක්(24) පැවති බව සඳහන් කරයි. එතුමා රුවන්වැලිසෑය ගොඩ නැගීම සඳහා මුල් ගල තබන ලද්දේත් වෙසක් පුර පසළොස්වක දිනකදී බැව් සඳහන් වෙයි. මෙසේ හෙළ රජ දවස සිට තුන් සිංහලේ තෙමඟුල් දිනය ලෙස අබිමන් පෑ වෙසක් දින මහිමය බටහිර විදේශ ආක්‍රමණයෙන් පසු මිලින වී ගියේය. මෙරටට පැමිණි පෘතුගීසීන් විසින් 1770 නොවැම්බර් 1වන දින සුවහස් කල් පැවති පොහෝ දින නිවාඩුව නැති කොට ඉරු දින නිවාඩු පණත සම්මත කරන ලදී.

වසර 300කට ආසන්න පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආදි ත්‍රිවිධ බටහිර විදේශික ග්‍රහණ නිසා අඳුරු ආගාධයේ ගිලී තිබූ ශ්‍රී ලංකාවේ බෞද්ධ බලය යළි පුනර්ජීවය ලබන්නට වූයේ 1873දී මොහොට්ටිවත්තේ ගුණානන්ද මාහිමිපාණන් වහන්සේ විසින් පැවැත්වූ පානදුරා වාදයේ අනුහසිනි.

වාදිභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද මාහිපාණන් වහන්සේගේ අභීත සිංහ නාදයේ රාවය සත් සමුදුර තරණය කොට ගොස් ඇමෙරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ දෙසවන නොවැකෙන්නට එවක නැග ආ බෞද්ධ පුනර්ජීවනයට එතරම් ලෙහෙසියෙන් සිය අභිමතාර්ථයන් මස්තකප්‍රාප්ත කර ගැනීමට නොහැකි වනවා නොඅනුමානය. එදා නැග ආ බෞද්ධ පුනර්ජීවනය දිග් විජය කරා මෙහෙයවනු වස් කෙරුණු අසිරිමත් ඇරයුමක් බඳු වූ පානදුරා වාදයේ කාහල නාදයෙන් කැළඹුණු ඕල්කට් තුමා ලක්දිවට පැමිණ ඉටු කළ අනුපමේය අමරණීය සේවාව කුඩා මහත් හැම සිංහලයකුගේම සදා භක්ති ප්‍රණාමයට හේතු වෙමින් පවතී. කර්නල් ඕල්කට් තුමා බ්ලැවැට්ස්කි මැතිණිය සමග 1880 මැයි 21වැනි දින ගාල්ලට පැමිණියේය. ගාල්ලේ විජයානන්ද විහාරයේදී පූජ්‍ය අක්මීමන ධර්මාරාම මාහිමිපාණන් වෙතින් පන්සිල් සමාදන් වී බුදු දහම වැළඳ ගත්තේය. පසුව කොළඹට පැමිණ බෞද්ධ ගිහි පැවිදි උතුමන් හමු වී කරුණු සාක්ෂාත් කරගෙන 1880 ජූනි 17වන දින පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ කොළඹ ශාඛාව ඇරඹුවේය. එතැන් සිට ලක්දිව බෞද්ධ සංස්කෘතිය හා සභ්‍යත්වය දියුණු කිරීමට උරදුන් එතුමා විසින් සිංහල බෞද්ධයින් ඒකරාශි කොට පිබිදවීමටත් උද්ඝෝෂණය කිරීමටත් සරසවි සඳරැස පත්‍රය අරඹන ලදී.

අභිනව බෞද්ධ ප්‍රබෝධයට උර දුන් කර්නල් ස්ටීල් ඕල්කට් තුමා ඉන්දියාවට ගොස් සිටි අතරතුරේ 1883 මාර්තු මස මොහොට්ටිවත්තේ ගුණානන්ද මාහිමිපාණන් වැඩ විසූ කොටහේනේ දීපදුත්තාරාමයේ විහාර ගෙය විවෘත කිරීම නිමිත්තෙන් මහා පෙරහැරක් පවත්වන්නට යෙදුණි. ඒ අවස්ථාවේ හට ගත් බෞද්ධ ක්‍රිස්තියානි කෝලාහලයේදී විශාල අලාභහානි සිදු කරමින් ජුවන් නයිදේ නමැති බෞද්ධයකුගේද මරණය සිදු විය. මෙහිදී පොලීසියට පැමිණිලි කරන ලද නමුත් කිසිවෙකු අත් අඩංගුවට ගැනීමට හෝ අලාභහානිවලට වන්දි ලබා දීමට කිසිදු පියවරක් නොගන්නා ලදී. එහෙත් එතැන් පටන් කොළඹ නගරයේ හෝ වෙනත් තැනෙක බෞද්ධ පෙරහැර පැවැත්වීම ආණ්ඩුව මගින් තහනම් කෙරිණි. මේ අසාධාරණ ක්‍රියාවට එරෙහිව මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට රැස් වූ ගිහි පැවිදි පිරිස බෞද්ධයින්ගේ අහිමි වූ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් යුතු බෞද්ධාරක්ෂක සභාව පිහිටුවා ගත්හ. එහිදී එංගලන්තයේ යටත් විජිත භාර මහ ලේකම් වෙත සංදේශයක් යැවීමට තීරණය කර ගත් ඔවුහු එය රැගෙන යා යුතු සියලු බලතල සහිත ලාංකික බෞද්ධ නියෝජිතයා වශයෙන් කර්නල් ඕල්කට් තුමාගේ නම ඒකච්ඡන්දයෙන් සම්මත කරගනු ලැබූහ. ඒ අනුව නොපමාව විදුලි පණිවුඩයක් යවා එතුමා ගෙන්වා ගැනීමට කටයුතු යෙදූහ.

සිය අයිතිවාසිකම් අහිමි වී අසාධාරණකම්වලට මුහුණ දෙමින් සිටි එවක සිංහල බෞද්ධයාගේ බුර බුරා නැඟෙමින් තිබූ විරෝධය එදා සරසවි සඳරැස පත්‍රයෙන් මෙසේ අනාවරණය විණි.

"යුරෝපීය ආණ්ඩු ලක්දිවට පැමිණ අවුරුදු තුන්සියයක් පමණ ගත විය. මේ කාලය තුළදී මේ ආණ්ඩුවලින් බුද්ධාගමට පැමිණි නා නා විධ විපත්ති ඉතා මහති. බලහත්කාරයෙන් බෞද්ධයන්ට හිරිහැර දුන් ප්‍රතිකාල් ආණ්ඩුව මෙන්ම ක්‍රිස්තියානි වුවන්ට නිලතල දීම්, ගෞරවභාවයෙන් සැලකීම් ආදියෙන් බෞද්ධයන් බලහත්කාර ලෙසින් ක්‍රිස්තියානි කරවූ ඕලන්දකාර ආණ්ඩු මෙන්ද ක්‍රියා නොකළ නමුත් අපේ සර්ව සාධාරණ ඉංග්‍රීසි ආණ්ඩුවෙන් බුද්ධාගමට පැමිණි විපතුත් ස්වල්ප නොවෙයි. ආවාහ විවාහ ලියා තැබීමේ බලය පාදිලිවරුන් අතටම දීමෙන්ද, වැඩි කොටසක් බෞද්ධයන්ම සිටින ලක්දිව පොදු ආදායමින් කිසිවක් බුද්ධාගමේ දියුණුවට නොදී ක්‍රිස්තියානි ආගම දියුණු කිරීම පිණිස වියදම් කිරීමෙන්ද, බුද්ධාගම සම්බන්ධ සමහර ඉඩකඩම් රාජසන්තක කර ගැනීමෙන්ද, බයිබලය උගන්වන පාඨශාලාවලට උපකාර කිරීමෙන්ද, ඉංග්‍රීසි ආණ්ඩුව කරණ කොට ගෙනත් බුද්ධාගමට බොහෝ විපත්ති පැමිණ තිබෙයි. මෙපමණක් නොව ඉංග්‍රීසි අණපණත් සර්වසාධාරණ නමුත් ඒවා පාලනය කළ ඉංග්‍රීසි, බර්ගර් මුලාදෑනීන්ද සමහර ක්‍රිස්තියානි සිංහල මුලාදෑනීන්ද ඕලන්දකාර ආණ්ඩුවේ මුලාදෑනි මෙන්ම ස්වකීය නිලතලවල බලය බුද්ධාගම දුර්වල කිරීමටත් ක්‍රිස්තියානි ආගම සමෘද්ධ කිරීමටත් ව්‍යවහාර කළෝයි. මෙසේ මේ ඉංග්‍රීසි ආණ්ඩුව අතින් බෞද්ධයන්ට දීර්ඝ කාලයක පටන් පැමිණි විපත්ති ගැන කල්පනා කළාම ඒ විපත්තිවලට ප්‍රතික්‍රියා වීමට කාලය දැන් පැමිණ තිබෙයි.

මෙපවත් ලෙසින් සිය අයිතිවාසිකම් ලබා ගැනීමට ඉදිරිපත් වූ බෞද්ධාරක්ෂක සභාව ඕල්කට් තුමාගේ අතින් යටත් විජිත භාර මහලේකම් වෙත යැවෙන සංදේශය ප්‍රධාන කරුණු සතරකින් සංගෘහීත කළහ.

1. සර්වඥයන් වහන්සේ ලෝ පහළ වූ දවස ආණ්ඩුවේ නිවාඩු දවසක් කිරීම
2. බෞද්ධ පෙරහැර නිරවුල් ලෙස නොහොත් පෙර පරිද්දෙන් බාධා රහිතව කිරීමට සලස්වා දීම
3. ලංකාවේ විහාර දේවාලගම් පවත්වාගෙන යාම නිරවුල් ලෙස පවරා දීම
4. බෞද්ධයන්ගේ විවාහ බන්ධනය කිරීමට බෞද්ධ විවාහ ලේකම්වරුන් පත් කරවා ගැනීම

මෙම කරුණු සතර ඇතුළත් සංදේශය පිළිබඳ සම්පූර්ණ වගකීම ඕල්කට් තුමා වෙත පැවරූ සිංහල බෞද්ධ ගිහි පැවිදි ප්‍රධානීහු එතුමා නිරනුමානව, සහනදායක පිළිතුරු ලබා ගෙන එනු ඇතැයි ඒකාන්ත වශයෙන් විශ්වාස කළාහ"

එහි සඳහන් ප්‍රධාන ඉල්ලීම වූ වෙසඟ පුන් පොහෝ දිනය ප්‍රසිද්ධ නිවාඩු දිනයක් කිරීම



# 2600 සම්බුද්ධත්ව ජයන්තිය

## දසත විශේෂ අතිරේකය



සම්බන්ධයෙන් කලෙක පටන් ඔවුන් කළ ආයාචනය පිළිබඳව සරසවි සඳරුසෙහි මෙසේ සඳහන් වෙයි.

"නමුත් ආණ්ඩුව අවුරුද්දෙන් හයෙන් කොටසක් පමණ ක්‍රිස්තියානි ආගමේ නිවාඩු දවස් කොට අධිකරණ ශාලාදිය එකී දිනවල වසතත් බෞද්ධයන්ගේ ආගම වශයෙන් ඉතා උතුම් අවකාශ දවසක් නොහොත් පුණ්‍ය කාලයක් ලෙස සලකන වෙසඟ පුර පසළොස්වක් දවසවත් ආණ්ඩුවේ නිවාඩු දවසක් නොකෙළේයි. ලංකාව බුද්ධාගමට කුල ගෘහයක් මෙනි. මෙහි වැසියන්ගේ ඉතා වැඩි කොටසක්ද බෞද්ධයෝය. මේ බෞද්ධයන් විසින් අවකාශ දවස් මෙන් නොහොත් ආගමික කටයුතු කරන දවස් මෙන් සලකන දවස් පණස් ගණනක් අවුරුද්ද තුළ තිබෙයි. ලංකාවේ වැඩි දෙනා අදහන බුද්ධාගමේ නිවාඩු දවසවත් ආණ්ඩුවේ නිවාඩු දවසක් නොකොට පිටරටින් පැමිණි ආගන්තුක වූ ආගමක් අදහන ස්වල්ප දෙනාට ඒ ආගමේ කටයුතු කිරීමට අවුරුද්දෙන් හයෙන් කොටසක් අවකාශ කාලය කර පැවැත්වීමට ඉංග්‍රීසි ආණ්ඩුවේ මහත් අයුත්තක් ලෙස සිතිය හැකිව තිබුණේයි. අනික් අතින් බෞද්ධයන් විසින් ඉතා උතුම් කොට සලකන මෙම වෙසඟ පුර පසළොස්වක් දිනදී ලංකාණ්ඩුව රාජ්‍ය කෘත්‍ය නොනවත්වා තිබීම කෙසේද කීවොත් මල් පහන් සුවඳ දුම් ආදිය රැගෙන වඳින පුදන පිණිසත් සද්ධර්මය ශ්‍රවණය පිණිසත් පන්සල්වලට යන්ට සැරසී සිටින ජනයාට ඒ ගමන් යන්ට එපාය කියා වචනයෙන් නොකියා ගමන වලක්වන පිණිස අධිකරණ ශාලාවට නැත්තම් කච්චේරියට එක්කෝ වෙන යම් රාජ කෘතියක් කිරීමට එන්ට කියා නියෝග කරන්නාක් මෙනි. මේ නිසා මෙකී දවස් රාජ කෘති නොනැවැත්ම බෞද්ධයන්ට බුද්ධාගම අදහන්ට ඉඩ නොදී කරන මහත් හිරිහැරයක්ය"

සමස්ත ලංකා ගිහි පැවිදි බෞද්ධයන්ගේ අයැදීම පරිදි 1884 පෙබරවාරි 8වනදා කොළඹට පැමිණි කර්නල් ඕල්කට් තුමා බෞද්ධාරක්ෂක සභාව මගින් පිළියෙල කොට තිබූ සංදේශය යටත් විජිත මහලේකම් වෙත භාර දී සාකච්ඡා කිරීම පිණිස එංගලන්තය බලා ගියේය. ඉන්පසු එතෙක් මෙතෙක් වූ තත් සිදුවීම් හා ලැබූ ප්‍රතිඵල ගැනත් සරසවි සඳරුස උදම් ඇනුවේ මෙලෙසිනි.

"ක්‍රිස්තු වර්ෂ 1880 අවුරුද්දේ දෙසැම්බර් මාසේ විසි හත්වැනිදා නිකුත් කළ සරසවි සඳරුස පත්‍රයෙහිද ඊට පසු නිකුත් කළ පත්‍රයකද වෙසඟ පුර පසලොස්වන දින නිවාඩු දවසක් කිරීමේ යුතුකමත් එසේ කරවා ගැනීමට බෞද්ධ ජනයන් විසින් උත්සාහ කළ යුතු බවත් කියා දීර්ඝ වාක්‍ය දෙකක් ලියා පළ කළෙමු. ගිය අවුරුද්දේ පෙබරවාරි මාසයේදී කර්නල් ඕල්කට් තුමා කොළඹ වාසී බෞද්ධයන්ගේ අයදීම පිට ලංකාවට පැමිණි කාලයෙහි ලංකාණ්ඩුව අතින් බෞද්ධයන්ට කරවාගත යුතුව තිබෙන දේ ගැන උතුමාණන් වහන්සේ සමග කතා කරද්දී වෙසඟ පුර පසලොස්වක දිනයත්, සිංහල අවුරුදු මංගල්‍යය දවසත් බෞද්ධයන්ගේ නිවාඩු දවසක් කිරීමේ යුතුකම සිප්කඩුවේ නායක ස්වාමිපාදයන් වහන්සේගේ අනුමතය පොදු ජනයා වෙනුවෙන් ප්‍රකාශ කොට කථා කෙළේය. මීට දෙතුන් දිනකට පසු විද්‍යොදය පිරිවෙණේ තෑගි බෙදා දෙන දවසේදී උතුමාණන් වහන්සේගේ එහි පැමිණීම සම්බන්ධව කථාබස් කර ගැනීමට නායක ස්වාමින්වහන්සේ සමග කර්නල් ඕල්කට් තුමා පැමිණි ප්‍රස්තාවේදීද මේ ගැන කතා කළ විට ලක් උතුමා එසේ කරන්ට කල්පනා කරන බව ඒ දෙපල සමග කී බව ඇසීමු. නමුදු ගිය අවුරුද්දේ වෙසක් පුර පසළොස්වක් දිනදී කොහොම නමුත් ඒ නිවාඩුව නොලැබුණෙයි. බෞද්ධ පෙරහැර නිරවුල් ලෙස කර ගැනීම ආදි බෞද්ධයන්ට ආගම අතින් ලංකාණ්ඩුව ලවා කරවා ගත යුතු කරුණු එංගලන්ත ආණ්ඩුවට මතක් කිරීම පිණිස කර්නල් ඕල්කට් තුමා එංගලන්තයට පැමිණි කාලයෙහි ප්‍රදේශ භාර මහාමාත්‍ය ඩර්බි සාමිට ලංකාවේ බෞද්ධයන්ට ඕනෑ කරන කරුණු මතක් කරද්දීද හින්දු රට ඉංග්‍රීසි ආණ්ඩුව විසින් එහි වැඩි හින්දුවරුන්ට ආගම අතින් දී තිබෙන නිදහස ආදිය මතක් කරමින් මේ සම්බන්ධයෙන් කරුණු රාශියක් ගිය දෙසැම්බර් මාසයේදී ආණ්ඩුව ලියා තිබෙයි. කර්නල් ඕල්කට් තුමා ලංකාවට පැමිණි කාලයෙහිදී උතුමාණන් වහන්සේ සමග මේ ගැන කතා කළේය. එවිට ඇතැම් අයගේ සිංහල අවුරුදු දවස නිවාඩු දවසක් කර ගැනීමට කැමැත්තක් තිබෙන බැවින් දෙදවසක් දෙන්ට නොහැකි නිසා මෙයින් කොයි දවස තෝරා ගැනීමට බෞද්ධයන් කැමතිද යන වග ආණ්ඩුවට මතක් කරන්ට කියූ ලක් උතුමා ඕල්කට් තුමා බෞද්ධ ගිහි පැවිදි ප්‍රධානීන් කරා මේ සම්බන්ධව ලියුම් යැවූයේයි. ඒ ලියුම් ලැබී බෞද්ධ ගිහි ප්‍රධානීන් විසින් වෙසඟ පුර පසලොස්වක් දින නිවාඩු දවසක් කර ගැනීමට කැමති වී අත්සන් කර එවන ලද ඒ ලියුම් උතුමාණන්වහන්සේ කරා යවන ලද්දේයි. මීට පසු වෙසඟ පුර පසලොස්වක් දින ආණ්ඩුවේ නිවාඩු දවසක් කොට ඒත්තු ගන්නා ලදැයි යන මේ ප්‍රීතිමත් ප්‍රවෘත්තිය අපට අහන්ට දකින්ට ලැබුණේයි. මේක ලංකාවාසී බෞද්ධ ජනයන්ට ලැබුණ මහත් ඓශ්වර්යයෙකි. මෙපමණ උතුම් වැඩක් බෞද්ධයාට කර දීමට අන්‍ය ජාතියක අන්‍ය රටක උපන් මහතෙක් විසින් මෙපමණ මහත් උත්සාහ දැරීම කොපමණ උතුම් කොට සැලකිය යුතුද? ලංකාවාසී බෞද්ධයන් කෙරෙහි කොපමණ කරුණාවක් කර්නල් ඕල්කට් තුමාගේ තිබේද යනු මෙයින් පෙනේ. මේ ඉසුර බෞද්ධයන්ට ගෙන දීමට ආණ්ඩුවට කාරණා මතක් කළ කර්නල් ඕල්කට් තුමාට සහ සිප්කඩුවේ නායක ස්ථවිරයන් වහන්සේටද තව මේ ගැන උත්සාහ දැරූ කොළඹ වාසී බෞද්ධයන්ටද මුළු ලක්දිවම බෞද්ධ ජනයා විසින් එකහෙළා ස්තූති කටයුතුයි."

1885 මාර්තු 27වැනි දින නිකුත් වූ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයකින් වෙසක් දින නිවාඩුව ප්‍රකාශයට පත් වීමේ ප්‍රීතියෙන් ඇළලී ගිය ලාංකික බෞද්ධ ජනතාව රජයේ අනුමැතිය ලැබූ ප්‍රථම වෙසක් පොහෝ නිවාඩු දිනය ඉතා ඉහළින් පැවැත්වීමට ලක ලෑස්ති වූහ.

ලාංකික බෞද්ධ ජන සමූහයා පමණක් නොව සමස්ත බෞද්ධ ලෝකයා පරමාර්ථ හා අධිෂ්ඨාන වශයෙන් එක් සේසත් කිරීම සඳහා සුසැදුණ බෞද්ධ ධජයක් මෙම ඓතිහාසික ප්‍රථම වෙසක් නිවාඩු දින ලක් දෙරණත මත ලෙළවීම පිණිස පිළියෙල කිරීම විශේෂ කමිටුවකට භාර කළහ. එම කමිටුව පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, පූජ්‍ය මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි, දොන් කරෝලිස් හේවාවිතාරණ, ඒ. පී. ධර්මගුණවර්ධන, විලියම් ද ආබෲ, සී. පී. ගුණවර්ධන, චාර්ලිස් ඒ. ද සිල්වා, එන්. එස් ප්‍රනාන්දු, පීටර් ආබෲ සහ විලියම් එච්. ප්‍රනාන්දු යන බෞද්ධ ප්‍රධානීන්ගෙන් සමන්විත විය.

මම කමිටුවේ තීරණයත්, බෞද්ධ කොඩියේ සැලැස්මත් 1885 අප්‍රේල් 17වන දින සරසවි සඳරුස පත්‍රය මගින් මෙසේ අනාවරණය කරන ලදී.

**"බෞද්ධයන් විසින් ඔසවන්ට ව්‍යවස්ථා කරගෙන තිබෙන කොඩියක්**

සර්වඥයන් වහන්සේ ලෝ පහළ වූ දින ප්‍රකාශ කරන සලකුණ වශයෙන්ද, ගෞරවයක් වශයෙන්ද, බුද්ධ රශ්මියෙන් වර්ණ සය ප්‍රකාශ කරන කොඩියක් එසවීමට කොළඹ වැසි බෞද්ධයන් විසින් සම්මත කරගෙන තිබෙයි. මේ කොඩිය මේ මස විසි අටවෙනිදාට පැමිණෙන වෙසඟ පුර පසළොස්වක් දිනදී කොළඹ මාලිගාකන්ද පිරිවෙණේ සහ කොටහේනේ දීපදුත්තමාරාම විහාර ස්ථානයෙහිද තවත් මේ අසල විහාරස්ථානවලද බොරැල්ල හුණුපිටිය ආදි කොළඹ පිහිටි අන්‍ය විහාරස්ථානවලද, කැළණි විහාරය ආදි ස්ථානවලද මනෝහර ලෙස ඔසවන ලද්දේයි. කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සභා ශාලාවේද කොඩියක් නගන ලදී.

බොරැල්ලේ පටන් විසිතුරු පෙළහරක් කොටහේනේ දීපදුත්තම විහාරයට ගෙන යන ලද්දේය. පංචිකාවත්ත පටන් බොරැල්ල පන්සලට පෙළහැරක් ගෙන යන ලද්දේයි. කොම්පඤ්ඤ වීදියේ හිට පෙළහරක් විද්‍යොදය පිරිවෙනට ගෙන යන ලද්දේයි. ලුණුපොකුණ පළාතේ සිටත් කොටහේනට ගෙන යන ලදී.

රාත්‍රී භාගයේ කොටහේනේ දීපදුත්තම විහාර ස්ථානයෙහි මොහොට්ටිවත්තේ ගුණානන්ද සාමින් වහන්සේ විසින් ධර්මදේශනා පවත්වන ලදී. රාත්‍රී භාගයෙහිදී සිප්කඩුවේ නායක ස්වාමින්වහන්සේ සිද්ධාර්ථ ගෞතම කුමාරයාණන් ලෝ පහළ වූ ආකාර සර්වඥ පද ප්‍රාප්ත වූ ආකාර ආදිය ප්‍රකාශ කරන ධර්මදේශනාවක් කළේයි. කොළඹ වැසි ප්‍රීතින්කර නොහොත් ආගම් විෂයෙහි මධ්‍යස්ථව සිටින්නන්ගේ ප්‍රධාන තැන්පත් මාර්ටින්ස් පෙරේරා මහත්මයා සහ උන්නැහේගේ සහෝදරයත් විසින් සර්වඥයන් වහන්සේට ස්තූති වශයෙන් ගායනාවක් පිරිවෙණේදී කරන ලද්දේයි. මේ ගායනාව කිරීම පිණිස පිටකොටුවේ දොන් බස්තියන් ගුරුන්නාන්සේ මහත්මයාගේ ශිෂ්‍යයෝද පැමිණ සිටියෝයි. පිරිවෙණේ ගායනාව කළාට පසු උන්නැහේලාගේ මිත්‍රයන්ගේ ගෘහවලටත් පැමිණ ගායනා කළ බව ඇසීමු.

කලින් ප්‍රකාශ කර තිබුණ පරිද්දෙන් මොහොට්ටිවත්තේ ගුණානන්ද සාමින්වහන්සේ කැළණියේ ධර්ම ශාලාවේදී මනෝහර කථාවක් කළේයි. මේ කථාව ඇසීමට දහස් ගණනක් බෞද්ධ ජනයා කැටි වූවෝයි.

යුරෝපීය ආණ්ඩු ලංකාවට පැමිණි අතික්‍රාන්තත වූ දීර්ඝ කාලය තුළ කිසිම බෞද්ධයෙකු විසින් ආණ්ඩුවෙන් ලබාගන්නට උත්සාහ නොකළ නිවාඩුවක් ලබා දීමට උත්සාහ කළ අන්‍ය ජාතියක පිට දේශයක උපන් කර්නල් ඕල්කට් තුමාට ලක්දිව බෞද්ධ පරම්පරාව මේ කළ මහත් ඉසුර ගැන අතිශයින්ම ස්තූති කටයුතු බවත් කර්නල් ඕල්කට් තුමා විසින් බෞද්ධයන්ගේ දියුණුව පිණිස යෝජනා කර තිබෙන වෙන කටයුතුවලටත් බෞද්ධයන් විසින් පිටිවහල්ව ක්‍රියා කළ යුතු බවත් මොහොට්ටිවත්තේ ගුණානන්ද සාමින්වහන්සේ වදාළේයි. මෙම දවස වෙසක් පුර පසළොස්වක දින නොවේ යැයි ඇතැම් අය අතර විවාදයක් වේ යැයි සිතෙතත් ජ්‍යොතිශ් ශාස්ත්‍ර ක්‍රම ආදියට එකඟ වූ වෙසඟ පුර පසළොස්වක දින මේ දවස බවද වදාළේයි.

බෞද්ධයන්ට මේ දවස නිවාඩු දවසක් කර දුන් අපක්ෂපාත උතුමාණන් වහන්සේට තුන්වරක් ප්‍රීති ඝෝෂා පවත්වමින් ස්තූති කිරීමටද මොහොට්ටිවත්තේ ගුණානන්ද සාමින් විසින් වදාරණ ලදින් උන්වහන්සේ කථාව අවසානයේදී සමුද්‍ර ඝෝෂාව පරයන තරම් උසස් නාදයෙන්
රැස්ව සිටි ජනයා තෙවිටක් ප්‍රීති ඝෝෂා කළෝයි"

# 2600 සම්බුද්ධත්ව ජයන්තිය

## දසත විශේෂ අතිරේකය

## පසුතැවිල්ල



අජාසත් රජු:
සුවාමිනි
මම
බාලයකු සේ
මෝඩයකු සේ
අන්ධයකු සේ
නොපැසුණකු සේ
කළෙමි මහ අපරාධයක්
දැහැමි ගති ඇති
දැහැමි ගුණ ඇති
දැහැමි රජදම් දැරූ
මාපියාණන්
ඉසුරු ලොබින් - පදවි ලොබින්
දිවි තොර කළෙමි
හැඟෙයි දැනෙයි වැටහෙයි
එහි වරද දැන්
දැවෙයි තැවෙයි කකියයි
මහද ඉන්

බුදුහු:
රජුනි
වරදමය කළ දේ ඔබ
එහෙත්...
පසු වුවද කළ වරද
සිතා වටහා ගැන්ම
යහපති !

(දීඝනිකාය සාමඤ්ඤඵල සූත්‍රය ඇසුරෙනි)

අනුවාදය - සිරිසේන විතානගේ

## හිමවතේ වෙසක් සඳ

සාදු නාද නොමැතිමුත්
දසත රැව් නැගෙන්නට
හදවතේ සිල් සුවඳ
පිරී ඇත නිසලවම

සිලි සිලියෙ බෝ සමිඳු
සැලෙන හඬ නොමැතිවද
සමාධී චිත්තයක්
වැඩේ බුදු සමිඳු ළඟ



සණ්ටාර හඬ නොමැත
අපට මෙහි ඇසෙන්නට
සුදෝ සුදු වෙසක් සඳ
පායලා අහස් ගැබ

මැණියනි පියාණනි
ඔබ දෙපා දහස් දුර
වඳින්නම් මෙහි ඉඳන්
වෙසක් පුන් පොහෝ දින

රුවන් අබේගුණවර්ධන
බ්‍රැම්ප්ටන්

සංයුක්ත නිකායේ කස්සප සංයුක්තයේ එන පරිදි කාශ්‍යප තෙරුනට කළ කළ අවවාදවලින් බුදුරජාණන් වහන්සේ කොතරම් දයාබර, මානුෂික, කාරුණික හා මිත්‍ර ලීලාවෙන්ද උන් වහන්සේගේ උත්තරීතර මානුෂිකත්වය ඔප්පු වේ.

"අත්ථාහි අත්ථනෝ නාථෝ.. කෝහි නාථෝ පරෝසියා"යයි තමන්ගේ විමුක්තිය තමා විසින්ම කාලය ශ්‍රමය උත්සාහය ධෛර්යය හා අධිෂ්ඨානය තුළින් සලසා ගත යුතු බව පෙන්වා දීමෙන්ද උන් වහන්සේගේ උත්තරීතර මානුෂිකත්වය ඔප්පු වේ.

උන් වහන්සේ මිනිසකු නිසාම බුදුවරයෙක් වූහ. බුදු වීම මිනිසකුට මිස දෙවියකුට කළ හැක්කක් නොවේ. බුදුවීමෙන් උන් වහන්සේ මිනිස් බුද්ධියට, මිනිස්කමට මිනිසකු විසින් ලබා දිය යුතු උසස්ම තැන උසස්ම ගෞරවය ලබා දුන්හ. ගුණවත් මිනිසා දෙවියන්ටත් වඩා උතුම් බව, බලවත් බව, ශ්‍රේෂ්ඨ බව පෙන්වූ එකම මනුෂ්‍යයා එකම ශාස්තෘවරයා බුදුහාමුදුරුවෝය.

මහ බඹුට, දෙවිවරුනට, මැවුම් කරුවනට වැඳුම් කළ රටක, එබඳු යුගයක මිනිසකු වූ බුදුන් වහන්සේ ඉපිද අනික් මිනිසුන් බලා සිටිද්දී දෙවියන්ගෙන් බඹුන්ගෙන් වැඳුම් පිදුම් ලැබූහ. ඇප උපස්ථාන ලැබූහ. මීට වඩා ආශ්චර්යයක් ඒ යුගයේ කවර නම් මනුෂ්‍යයකුගෙන්වත් සිදු නොවීය. සිල්වත් ගුණවත් මිනිසාට දෙවියන්ට වඩා ගරු බුහුමන් කරන බව බුදුහු වදාළහ.

තමාට නොපෙනෙන නොවැටහෙන හැම බලයක්ම දෙවියන් පිට පැටවූ මිනිසාට ඒ දේව පිහිට නැතිව තමාගේම පිහිට ලබා ගන්නා ලෙස "අත්ථ දීපා විහරථ, අත්ථ සරණා න අඤ්ඤ සරණා" යයි බුදුහු වදාළහ. ආත්ම ශක්තිය, ආත්ම විශ්වාසය පිළිබඳව මෙයට වඩා සත්‍යයක් තවත් නැත. මිනිස් බලයෙන්, මිනිස් ශ්‍රමයෙන් ලොව කළ නොහැකි දෙයක් නැති බවත් ඒ නිසා අනුන් පිට පටවා මිනිසුන් ස්වකීය බුද්ධිය හා ශ්‍රමය ක්‍රියාවේ නොයොදා එයින් වැඩ නොගෙන නිකම් සිටීම මිනිස් කමට මදි කමක් බවත් බුදුහු වදාළහ. "ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනේ"යයි හමුදාපතියකු මෙන් ස්වකීය සුචරිත හමුදාව දිරි ගැන්වූහ.

බෞද්ධයන් වශයෙන් අපට ඇති ලොකුම සතුට ප්‍රීතිය සැනසීම හා ආඩම්බරය නම් අප අදහන ශාස්තෘවරයාණන් ඉතිහාසයක් ඇති උත්තරීතර මනුෂ්‍යයකු වීමයි.

5වන පිටුවෙන් ☜

හැව්රිදි වැඩිහිටියෙක් දිස් වේ. චුන්දකර්මාර පුත්‍රයාගේ ආහාර වැළඳීමෙන් පසු බුදුරදුනට දරුණු රෝගයක් වැළඳුණේය. මෙහිදී භාවිත කළ වචන තුළින් වතුර පිපාසයෙන් පෙළෙන රෝගියෙක් දිස් වේ.

තවද බුදුරජාණන් වහන්සේ මහණුන්ගෙන් ඉල්ලා සිටින්නේ "මාගේ කීමට එක දෙයක් අත් හරින්න. එය අත හැරියොත් නුඹලා අනාගාමි වන බවට මම පොරොන්දු වෙමි. මම ඇප වෙමි. ඒ එකම දෙය නම් ලෝභයයි"යනාදි වශයෙන් ඉති වුත්තක ඒකක නිපාතයේ එයි.

"මම පොරොන්දු වෙමි. මම ඇප වෙමි" යන මේ බුදු වදනෙහි ඇත්තේ සාමාන්‍ය මිනිස් ස්වරූපයයි. "මම පොරොන්දු වෙනවාය. මම ඇප වෙනවාය" කියා හැමෝටම හැම විටම නොකියති. දැකීමෙන්, කළ පුරුද්දෙන්, අත්හදා බැලීමෙන් ලැබූ විශ්වාසය ඇති කෙනකුම කියන කථාවකි මෙය.

අන්තිම හුස්ම හෙළන මොහොතෙහි පවා අනුනට සේවය කිරීමේ බලාපොරොත්තුව මෙයින් පෙනේ. සෝචනීය අවස්ථාවක මෙබඳු ඉල්ලීමක් කළ ගුරුවරයෙක්, නායකයෙක්, ශාස්තෘවරයෙක්, මවෙක්, පියෙක්, වැඩිහිටියෙක් මේ මානව ඉතිහාසයේ නම් නොසිටියේමය. සේවය කිරීමට බැඳී සිටින අයට මෙය හොඳ ආදර්ශයකි.

ලාභ, සත්කාර, කීර්ති, ප්‍රසංශා, බලකාමය, තනතුරු, ගිජුකම, නම්බුව, ප්‍රසිද්ධිය යන මේවා ඉතාම දරුණු භයානක, විනාශකාරී, විපත්තිදායක ඒවා බව ප්‍රකාශ කළේ බුදුරජාණන් වහන්සේගේ තිබූ උත්තරීතර මානුෂිකත්වය නිසාය. මේවා අත්හදා බැලීමෙන්ම ආදීනව දැක පිළිකුල් කොට අත්හැර දැමූයේ උත්තරීතර මනුෂ්‍යයකු නිසාය.